# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත්
මව්බිමත්
ස්වර්ගයට
වඩා උතුම්ය!
Mother and
Motherland
are nobler
than Heaven



FOR FREE
CIRCULATION
නොමිලේ
බෙදාහැරීම
පිණිසයි
VOLUME 14
NUMBER 09

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JANUARY 10, 2012 ජනවාරි මාසය (බුද්ධ වර්ෂ 2555 දුරුතු මාසය) http://www.lankaheritage.com/lankaviththi/





# සුබ අනාගතයක්?

♦ සංජය විමලරත්න විසිනි

**ත**වත් වසරක් උදාවිය. මේ නව වසර දෙස ඉහළ ප්‍රාර්ථනා සහිතව සැවොම බලති. අපේ රට ඉතා දීර්ඝ කාලීන විනාශකාරී දරුණු ත්‍රස්තවාදී යුද්ධයක පැටලී සිට ඉන් මිදී තවම වසර දෙකක් ගත වූවා පමණි.

පසුවූ දශක තුනක කාලයක් තිස්සේ රටේ සියළුම ජන කොටස් අත් දුටු සහ වින්ද දුක්ඛදායක තත්වයන්ගෙන් ගොඩ අවුත් ඔවුන් සාමාන්‍ය ජීවිතයක් කරා යළි හැඩගස්වන අන්දමේ ක්‍රියාවලියක් රජය අප-හසුවෙන් මුත් පටන්ගෙන සාර්ථකව ඉටුකර ඇත. මේ කාරණා ඉටු වූයේ අභ්‍යන්තර සහ බාහිර සතුරන්ගේ නොයෙක් කරදර කිරීම් මධ්‍යයේය.

ප්‍රභාකරන් අතුළු කොටි නායක යින් ඝාතනය වී, එල්ටීටීඊ ත්‍රස්තවාදී කල්ලිය පරාජයට පත් මුල් දවසේ සිටම, පිටරටවලට පැන එහි සියළු සැප පහසුකම් විඳින කොටි ත්‍රස්තවාදී වල්ග කැලිද, දෙමළ ඩයස්පෝරාවද කෑගසන් නට වූයේ ලංකා රජය දෙමළ ජනයාට හරිහැටි නොසලකන බවත්, මේ රජය යටතේ ඔවුන් දුක්විඳින බවත්ය. එහෙත් උන් කොටින් විසින් ම විනාශකර අඩාල කරන ලද උතුරේ දෙමළ ජන ජීවිත සහ ගොඩනැගිලි යථා තත්වයට පත්කරන් නට ලංකා රජය දිවා රෑ ඉටුකරගෙන යන වැඩපිළිවෙල ගැන වචනයකුදු කීවේ නැත. මෑතකදී සිදුවූ මේ සියල්ල කාටත් මතක ඇත. එසේම බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනිය පැතිරවූ බොරු චෝදනාත්, බැංකි මූන් අටවන්නට වෙර දැරූ දරුස-මාන් වාර්තාව හමුවේත් ඒවා නිශ්ප්‍රභා කරන්නට ශ්‍රීලංකා රජයට ජාත්‍යන්තර වේදිකාවේ ගන්නට වූ වෙහෙස කොතෙක්දැයි කියාත් අපි දනිමු.

රජයේ එම හොඳ වැඩ සියල්ලම සහ රට අභ්‍යන්තරයේ සිදුවන සංවර්ධන කටයුතු ද අගය කරන අතරම යම් යම් දේ වර්තමානයේ සිදුවෙමින් පවතින ආකාරයද, ඒවා ගමන් ගන්නා දිසාව ගැනද ජනතාව තුළ යම් යම් සැක උපදින්නට පටන්ගෙන ඇත.

කර ඇති දේවල් ද, ඊට ගෙන ඇති ක්‍රියා මාර්ග ද ගැන සලකා බලන කල්හි නායකත්වය දරන අය කළ යුතු නොකළ යුතු දේ මොනවාදැයි පටලවා ගෙන ඇති බවක් වැටහේ. මෙතෙක් ඔවුනට තිබුණු දැක්ම හා විශ්වාසයට කුමක් වීදැයි සිතේ. ඉතා සුළු දේවල් පවා ඔවුන් වරද්දා ගන්නා බව පෙනේ.

යුද්ධය දිනූ කල මුළු රටම එකාමෙන් උදම් වූ සැටි අපි කවුරුත් දුටුවෙමු. යුද්ධය ජයග්‍රාහී ලෙස අවසන් කළ රණ විරු-වන්ට මෙන්ම රජයේ නායකයින් ඇතුළු මැති ඇමතිවරුන් හර සරින් පිළිගනු ලැබිණ. එහෙත් ඉතා ඉක්මනින් ඒ දීප්තිය අඩු වන්නට වූයේ මැති ඇමතිවරුන්ගේ නොමනා කටයුතු නිසාය.

රජයේ මන්ත්‍රීවරු මත්කුඩු ජාවාරමට සම්බන්ධ බව අගමැතිවරයාම පාර්ලිමේන්තුවේදී කියා සිටියේය. එක් ඇමතිවර යෙක් තම පළාතේ සමෘධි නිලධාරියෙක් කඹයකින් ගසකට තබා බැන්දේය. තවත් අවස්ථාවක ඔහුම විදුහල්පතිවරයෙකුගේ කම්මුලට ගැසුවේය. එසේම ඔහු වෙළෙන්දන්ගෙන් කප්පම් ගන්නා බව හෙළි විය. මේ සියළු දේ රටේ ජනතාවට රහසක් නොවන බව රජය ද දනී. එහෙත් දේශපාලකයින් තවම හැසි-රෙන්නේ එම පුහු අහංකාර තත්වයෙනි.

මැති ඇමතිවරුන් කරන මහා මුදල් නාස්තිය ඉහවහා ගොස් ඇත. ඔවුන්ගේ දරුවන්ගේ මගුල් තුලාවලට මහා ධනස්කන්ධයක් වියදම් කරති.. මංගල ආරාධනා පත්‍රය පවා තඹ කොළවල මුද්‍රණය කරති. ඔවුන් චාම්බව තුළින් ජනතාවට ආදර්ශයක් විය යුතු නමුත් සංවර්ධනය ගැන කතාකරමින් මේ පෙන්-වන්නේ අන්ත නාස්තියයි. මේ සියල්ල මාධ්‍යය මගින් හෙළි කළත් මැති ඇමතිවරුන්ට එසේ රජයේ වරප්‍රසාද තම පුද්ගලික දේපළක් සේ සලකා කටයුතු කරන්නට කිසිදු ලැජ්ජාවක් නැත.

ත්‍රස්තවාදී යුද්ධය අවසන් වූ අවස්ථාවේ යළිදු කිසිදු ත්‍රස්තයෙකුට ආයුධයක් ඔසවන්නට ඉඩ නොදෙන බවටත් රටේ ජනතාවට වෙඩිහඬක් යළි ඇසෙන්නට ඉඩ නොතබන බවටත් අපරාධවලින් තොර ලංකාවක් බිහිකරන බවටත් රජයේ ආරක්‍ෂක අමාත්‍යංශයෙන් කියැවුණා අපට මතකය. එය එසේ විය යුතුය. රටේ නීතිගරුක පුරවැසියනට නිවීහැනහිල්ලේ ඉන්නට එවිට ඉඩ ලැබේ. එහෙත් කියුම් එසේ වෙතත් කාරණා කටයුතු වන්නේ එසේ නොවේ.

කොලොන්නාවේදී මහදවල් රජයේ පාක්‍ෂික මන්ත්‍රීවරුන් දෙදෙනෙක්ම එකි-නෙකාට වෙඩි තබාගත් අතර එක් මන්ත්‍රී වරයෙක් මියගියේය. අනෙකාටද බරපතල තුවාල සිදුවිය. යුද්ධයට පාවිච්චි කළ යුද උපකරණ තවමත් මැරයන් ළඟ ඇත. යුද සමයේ මෙන්ම දැනුදු ජනතාවට ජීවත් වන්නට සිදුව ඇත්තේ භීතියෙනි. දේශ පාලකයින්ගේ හෙංචයියලා ළඟ ගිනි අවි ඇත. ඔවුන් ගමන් බිමන් යන්නේ ඒවාද සමගය. ඇමරිකාවේ මෙන් ලංකාවේ ද තුවක්කු සංස්කෘතියක් නිර්මාණය වී තිබේ. මේ කිසිවකට රජය ප්‍රතිකර්මයක් සලසන බවක් ජනතාවට නොපෙනේ.

අවුරුදු තිහක් තිස්සේ තිබූ කුරිරු යුද්ධයක් අවසාන කිරීමට මේ රජයට හැකිවිය. එය ඉතාම ප්‍රශංසනීය කට යුත්තකි. ඊළඟට අවශ්‍යවන්නේ ප්‍රතිසංස් කරණ කටයුතු මගින් රට යළිත් ප්‍රකෘති තත්වයට නංවා යහපත් අනාගතයක් කරා ගෙන යාමය. ඒ අනුව කටයුතු කරන්නට පොරොන්දු වෙමින් මේ රජය වසර දෙකකට පෙර දැවැන්ත කටවුට් පෝස්ටර් සහ දැන්වීම් මගින් වචන දෙකකින් පමණක් පැහැදිලිවම ප්‍රකාශ කර සිටියේ සුබ අනාගතයක්! යන පාඨයයි.

එහෙත් අද ඒ කියමනට ප්‍රශ්නාර්ථයක් (?) අපේ බහුතර ජනතාව එකතු කර ඇත. මෙය කෙළවරවන්නේ සුබ අනාගතය කින් නොවේ! බහුතරයක් දැන් සිතන්නේ එලෙස නම් එය මේ රජය තේරුම් ගත යුතුය. එසේ කරනු ඇතැයි මේ නව වසර ලැබූ මොහොතේ අපි ශ්‍රීලංකා රජයේ නායකයන්ගෙන් බලාපොරොත්තු වෙමු!

සිත දුක් සිඳී හිරු දුටු හිම කැට විලස
අත මිට සරුව සිරි විමනක් වී නිවස
වත නිති සිනහව ද ලැබ හොඳ මිතු පිරිස
පත නෙමි එසුබ සිරි! එළඹුණ නව වරුස

**Clearing all sorrows like snow melting in the sun**
**Being well off in a home that is full of peace and fun**
**Let there be frequent smiles; many good friends to cheer**
**I wish you the best of luck, with the dawn of the New Year !**

♦ දයා ආනන්ද රණසිංහ ♦ *Daya Ananda Ranasinghe*




අප සැමගේ විශ්වාසය දිනූ
FAST CASH
SEND TODAY - COLLECT TODAY



විස්තර
පිටු අංක
3